**ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

---

<u>පුනරාවර්තන වියදම්</u>

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| උපරිමාධිකරණ විනිශ්වයකාරවරුනගේ වැය ශිර්ෂයට අයත් රු.61,948 ක රක්ෂණ වියදමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ වැය ශිර්ෂය යටතේ ද ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ වැය ශිර්ෂයට අයත් රු.77,436 ක රක්ෂණ වියදමක් උපරිමාධිකරණ විනිශ්වයකාරවරුනගේ වැය ශිර්ෂය යටතේ ද ගිණුම්ගත කර තිබුණි. | අදාල වාහන ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කටයුතු සඳහා භාවිතා කල බැවින් එම ශීර්ෂයෙන් ද උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ කටයුතු සඳහා භාවිතා කල බැවින් ශීර්ෂ අංක 04 යටතේ ද ගෙවීම් සිදු කර ඇත. | නිවැරදි වැය ශිර්ෂ යටතේ ගිණුම් ගත කල යුතු වේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**(අ) මූල්‍ය නොවන වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂයේ මිල දී ගත් වත්කම් වටිනාකමට අදාලව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ හා භාණ්ඩාගාර සටහන අතර රු.3,342,396 ක වෙනසක් විය. | CIGAS සමග මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර ගිණුම් සහ දෙපාර්තමේන්තු ගිණුම් සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. |

**(ඇ) මූල්‍ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්‍රීය ජංගම ගිණුමක පැවති සමාලෝචිත වර්ෂයේ අවසාන ශේෂය රු.21,014,984 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මෙම බැංකු ගිණුම දැනට ක්‍රියාකාරී නොවන බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ සදහන් කර නොමැති අතර මෙම ගිණුමේ ශේෂය මහා භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කරමින් පවතී. | අක්‍රීය ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුවේ. |

**1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 වසරේ සිට ඉදිරියට ගෙන එන දෙපාර්තමේන්තු පොත්වල වැඩියෙන් දක්වා තිබූ රු.68,245 ක හර ශේෂය නිරවුල් කර නොතිබුණි. | 2011 වසරේ සිට ඉදිරියට එමින් පවතින මෙම ශේෂය ලේඛන සොයා ගැනීමට නොහැකි වීම මත මෙතෙක් නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත. | වසර ගණනක් පැරණි නිරවුල් නොවූ ශේෂ නිරවුල් කල යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) නොසැසඳුණු කේවල ණය ශේෂ හේතුවෙන් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ අවසන් ශේෂය රු.26,860 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම නොසැසඳීම් නැවත පරීක්ෂා කර ඉදිරියේදී නිවැරදි කර දැනුම්දීමට කටයුතු කරමි. | කේවල ණය ශේෂ, සැසඳුම් ප්‍රකාශයේ ණය ශේෂ වලට සමාන විය යුතු වේ. |

**1.6.4 තැන්පතු**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| නිරවුල් නොකරන ලද රු.26,314,512 ක තැන්පතු, තැන්පත් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර වර්ෂය අවසානයට තැන්පත් ලේඛනයේ ශේෂය හා භාණ්ඩාගාර සටහන් ශේෂය අතර රු.34,841 ක නොසැසඳීම් පැවතුණි. | එක් එක් වර්ෂය සඳහා වෙනම තැන්පතු ලෙජරය බැගින් පවත්වාගෙන යනු ලබන අතර ඒ අනුව 2020 වර්ෂය සඳහා ද තැන්පතු ලෙජරයක් ආරම්භ කරන ලදී. මෙම වෙනස පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ CIGAS අංශය වෙත දැනටමත් දැනුම් දී ඇත. | නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කරන තෙක් ඉදිරියට ගෙන ආ යුතු වේ.<br>භාණ්ඩාගාර ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සැසදී තිබිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ)** මූලධන වැය විෂයයන් 02 ක රු.500,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | ගොඩනැගිලි සහ වාහන සඳහා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් අපේක්ෂා කලද 2020 වර්ෂය තුල එවැනි වියදම් ඇති වී නොමැත. | වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව පිළියෙල කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වැය විෂයයන් 05 ක ඉතිරියේ ප්‍රතිශතය සියයට 11 සිට සියයට 99 ක පරාසයක් ගෙන තිබුණද සාවද්‍ය ලෙස ප්‍රතිශතය අඩුවෙන් දක්වා තිබූ හෙයින් ඉතිරි වීම් වලට හේතු ද ඉදිරිපත් කර නොතිබුණි. | . 1101, 1102, 1201, 1202, 1301 - කෝවිඩ් 19 හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 6 හි 3.5 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ඇ)** | එක් වැය විෂයක ඉතිරිය සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 10.06 ප්‍රතිශතයක් වුවද එම ඉතිරිවීම් සඳහා හේතු දක්වා නොතිබුණි. | කෝවිඩ් 19 හේතුවෙන් පුහුණුවීම් නොපැවැත්වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් සිදු වී ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 6 හි 3.5 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ඈ)** | මූලධන වැය විෂයන් 02 ක් සඳහා සලසා තිබූ පිළිවෙලින් රු.9,300,000 ක හා රු.18,400,000 ක අමතර ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.4,281,020 ක් හා රු.9,212,286 ක් ඉතිරි වී තිබුණි. | 2020 දෙසැම්බර් 01 දින නව විනිසුරුවරුතුමන්ලාගේ දිවුරුම්දීමත් සමග රෙජිස්ට්‍රාර් කාර්යාලය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ අනෙකුත් උපකරණ මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන ලබාගත් අතර 2020 දෙසැම්බර් 31 දින වන විට සැලසුම් කර පරිදි මිලදීගැනීම් සිදු කිරීමට නොහැකි විය. | සැලසුම් සහගත ලෙස අමතර ප්‍රතිපාදන ලබාගත යුතු වේ. |
| **(ඉ)** | වෙනත් වැය ශිර්ෂයයන් දරා තිබූ රු.185,620 ක් වියදම් මූල්‍යකරණ ප්‍රකාශයේ සත්‍ය වියදමට ඇතුළත් කර නොතිබුණි. | වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් සිදු කල වියදම සත්‍ය වියදමට එකතු කර පෙන්වා නොමැති බව සඳහන් කරමි. | සත්‍ය වියදමට වෙනත් වැය ශිර්ෂ දරන ලද වියදම ද ඇතුළත් කළ ගත යුතු වේ. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 454 දරන මුදල් රෙගුලාසිය 454 | මිල දී ගැනීම් හා නිකුත් කිරීම් බඩු වට්ටෝරු පොතට ඇතුළත් කර නොතිබීම නිසා තොග පොත් ශේෂය හා තථ්‍ය ශේෂය අතර භාණ්ඩ වර්ග 10 ක ඒකක 61 ක අතිරික්තයක් හා භාණ්ඩ වර්ග 03 ක ඒකක 24 ක ඌනතාවයක් තිබුණි. | තථ්‍ය ශේෂය මත බඩු වට්ටෝරු පොත නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 හා 05 ඡේද | නිලධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2018 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.2 ඡේදය | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **i.** 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02,05 හා 07 ඡේද | මූල්‍ය නොවන වත්කම්වල නිවැරදි තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට හා වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය පරිදි මේ වසරේදී වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>------------------ |
|---|---|---|
| බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව බැංකුගත නොවූ 2017 වසරේ සිට ඉදිරියට ගෙන එන රු.48,978 ක ශේෂයක් නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | 2017 වසරේ සිට පවතින රු.48,978 ක ශේෂය සම්බන්ධයෙන් වන විනය ක්‍රියාමාර්ග අවසන් වූ විගස එහි තීරණය මත පියවීමට කටයුතු කරමි. | බැංකු ගත නොවීමට හේතු හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළයුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

----------------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය හා මාර්ගෝපදේශ 14 ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව සකස් කරමින් පවතින අතර අවසන් වූ විගස ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් කාර්මික විද්‍යාලය වෙත භාරදීමට කිරීමට නිර්දේශ කර තිබූ ඌන උපයෝජිත වාහන 03 ක් නිර්දේශිත පරිදි භාර දී නොතිබුණි. | කාර්මික විද්‍යාලය වෙත එම වාහනය රැගෙන යන ලෙස ලිපි මගින් දැනුම් දී ඇති අතර සිහි කැඳවීම් ද යවා ඇත. | භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ පරිදි ක්‍රියාකල යුතුවේ. |
| **(ආ)** වර්ෂයක කාලයක සිට අධිකරණ අමාත්‍යාංශයට ලබාදී තිබූ රු.3,000,000 ක් වටිනා වාහනයක් හා අධිකරණ අමාත්‍යාංශයෙන් ලැබුණු රු.4,000,000ක් වටිනා වාහනයක් විධිමත්ව පවරා දීමට හා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප විසින් ලබා දී ඇති වාහනය පවරා දීමටද අප වෙත ලබාදී ඇති වාහනය පවරා ගැනීමටද අවශ්‍ය කටයුතු සිදු කරමි. | ආයතනය සතු වත්කම් විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, මුදල් රෙගුලාසි 315 (1), මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත හා 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 17 කගෙන් ඇප අයකර ගෙන නොතිබුණි. | ඇප තැබීම සඳහා අවශ්‍ය ලේඛණ අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය ලද විගස ඇප ලබාගැනීමට කටයුතු කරමි. | අදාල චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, ඇප ආඥා පනත හා අමාත්‍යාංශ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක පුරප්පාඩු 81 ක් පැවති අතර අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ජ්‍යොෂ්ඨ මට්ටමේ නිලධාරින් දෙදෙනෙකු හා රියදුරෙකු සේවයේ යොදවා තිබුණි. | අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියේ නිලධාරීන් 09 දෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව සඳහා අනුමත වී ඇති නමුත්, 2020 දෙසැම්බර් 31 දින වනවිට ලබාදී ඇත්තේ අධිකරණ නිලධාරින් දෙදෙනෙකු පමණි. එසේම අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියේ නිලධාරිණියන් දෙදෙනෙකුගේ සේවය අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත. ගරු අභියාචනාධිකරණ විනිසුරුවරයකුගේ රියදුරු මහතා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අනුයුක්ත කර ඇත . | අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර අතිරික්ත නිලධාරීන් අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ද්විතීයික මට්ටම තුළ අධිකරණ යතුරු ලේඛිකා තනතුරු 15 ක් 2021 ජූනි 21 දින වන විටද පුරප්පාඩුව පැවතුණි. | 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වැඩිවීමට සමගාමීව කාර්ය මණ්ඩලය වැඩි කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් මේ වන විට බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |